පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 290

ආයතනයේ නම - ප්‍රවාහන අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 290

நிறுவனத்தின் பெயர் - போக்குவரத்து அமைச்சு

பாராளமன்றத்தின் அரச கணக்கு குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series Number - 290

Name of the Institution - Ministry of Transport

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee On Public Accounts in terms of standing order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : ප්‍රවාහන අමාත්‍යාංශය

පළමු කොටස : 93:00		
අනු අංකය	කමිටුව විසින් පෙන්වා දී ඇති අඩුපාඩු	ආයතනින වශයෙන් ගනු ලැබූ පියවර සහ ඉදිරියේ දී ගැනීමට අපේක්ෂිත පියවර
1	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත	ප්‍රවාහන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි සියලුම වාහනවල ලියාපදිංචි සහතික ප්‍රවාහන අංශය භාරයේ පවතී. වෙනත් ආයතන වෙතින් මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇති වාහනවලට අදාළ ලියාපදිංචි සහතිකවල ඡායා පිටපත් ප්‍රවාහන අංශය සතුව ඇත. තවද වෙනත් ආයතනවලින් වාහන පවරා ගැනීමේ කටයුතු තවදුරටත් සිදුකරමින් පවතී.
2	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි	මෙම අමාත්‍යාංශය යටතේ පවතින සෑම වාහනයකම රාජ්‍ය ලාංඡනය හා අමාත්‍යාංශ නාමය භාෂා තුනෙන්ම සඳහන් වන නාම පුවරුවක් ප්‍රදර්ශනය කර ඇත. එසේම රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කර නොමැති වාහනවල රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරමින් පවතී.
3	වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	ගර්හිත වාහන අපහරණය කරීමට පෙර අධ්‍යාපන හෝ වෙනත් ආයතනයක ප්‍රයෝජනය සඳහා යොමුකිරීමට හැකි දැයි සොයා බලා ඒ අනුව අංක 14 ශ්‍රී 0551 දරණ රථය යාපනය විශ්වවිද්‍යාලයේ ඉන්ජිනේරු උපාධිය හදාරණ ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලබා දීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. ඒ සඳහා එම වාහනයේ ලියාපදිංචිය අවලංගු කර ඇති අතර රථය යාපනය විශ්වවිද්‍යාලය වෙතින් රැගෙන යාමට නියමිත ය.
4	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි	මෙම අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිට සේවය හැරයන ලද සහ සේවයෙන් පහ කරන ලද නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ 3ක් ඇත. ඒ.ඩබ්.ඒ.යූ.ජේ.අලහකෝන්මහතා - රු.198,138/= එච්.එම්.බණ්ඩාර මහතා - රු. 87,600/= පී.ඩබ්.එම්.පී.පොඩිමැණිකේ මිය - රු. 121,945/= ● ඒ.ඩබ්.ඒ.යූ.ජේ.අලහකෝන් මහතා විසින් සේවයේ හැරයාමේ නියෝගයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව

		වෙත 2020.07.21 දිනැතිව අභියාචනය කර ඇත. එම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2021.08.03 දිනැතිව නිෂ්ප්‍රභ කර ඇති අතර එම තීරණයට එරෙහිව අභියාවක විසින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත.එම තීන්දුව ලැබෙන තෙක් පෞද්ගලික ලිපි ගොනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කර ඇති අතර 2022.03.09 දින පෞද්ගලික ලිපි ගොනුව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත යොමු කර ඇත. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් තීන්දුවක් මෙතෙක් ලබාදී නොමැත. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙතින් තීන්දුවක් ලබාදෙන තෙක් ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු රදවා තබා ඇත. ● එච්.එම්.බණ්ඩාර මහතාගෙන් හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා 2018.12.14 දිනැතිව නීතිපති වෙත දන්වන ලදුව, නඩු අංක DMR 3212/2021 යටතේ 2021.10.14 දින සිට නඩු පවරා ඇත. එම නඩුවේ සිකාසි කැඳවීම 2023.06.27 දින සිදුකළ අතර මේ සඳහා විත්තිකරු වන එච්.එම්.බණ්ඩාර මහතාට පෙනී සිටින ලෙස දන්වන ලදී. නමුත් එම දිනයේ එච්.එම්.බණ්ඩාර මහතා අධිකරණයේ පෙනී නොසිටි අතර ඉදිරි අධිකරණ කටයුතු සම්බන්ධ උපදෙස් නීතිපති දෙපාර්තමේන්තු මඟින් ලිඛිතව දන්වන බව වාචිකව නඩු දිනයේදී ප්‍රකාශ කරන ලදි. ● පී.ඩබ්.එම්.පී පොඩිමැණිකේ මිය සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත අභියාචනය කරන ලද අතර, පී.ඩබ්.එම්.පී පොඩිමැණිකේ මිය පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය හමුවේ අඛණ්ඩව අවස්ථා තුන කදී පෙනී නොසිටීම මත එකී අභියාචනය පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය විසින් 2023.06.14 දිනැතිව නිශ්ප්‍රභ කර ඇත ඒ අනුව 2023.08.10 දිනැතිව හිඟ ණය ශේෂය අය කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මේ අතර පී.ඩබ්.එම්.පී.පොඩිමැණිකේ මිය රු.1000/= බැගින් ගෙවීමට 2023.10.10 දිනැතිව අනුමැතිය ඉල්ලා ඇති අතර ඒ සඳහා අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා නොදෙන ලදී. මේ අනුව නීතිපති දෙපාර්තමේන්තුව විසින් ණය ශේෂ අයකර ගැනීමට අදාළ ඉදිරි කටයුතු සිදු කරනු ඇත.

5	මු.රෙ 371 හි වන සීමාව ඉක්මවා අතුරු අග්‍රීම නිකුත් කර තිබුණි	මු.රෙ 371 හි සීමාව තුල අතුරු අග්‍රීම නිකුත් කරනු ලැබේ.
6	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි	2021, 2022 වර්ෂවලදී එවකට පැවති රජයේ ප්‍රතිපත්ති අනුව උපාධිධාරීන් 50,000ක් පමණ රාජ්‍ය සේවය සඳහා බඳවා ගන්නා ලදී. එසේ බඳවාගන්නා ලද උපාධිධාරීන්ගෙන්, අමාත්‍යාංශයේ ඉල්ලීම් අනුව 55ක් පමණ සංවර්ධන නිලධාරීන් මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලදී. අමාත්‍යාංශය යටතේ ඇති මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කිරීම සඳහා මෙලෙස සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම සිදුකරන ලද අතර, එමනිසා අනුමත කාර්ය මණ්ඩල සීමාව ඉක්මවා යාම සිදුවිය. කෙසේවෙතත් 2023.03.14 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සඳහා අනුමත කළ කාර්ය මණ්ඩල ප්‍රමාණයට අනුව පමණක් සංවර්ධන නිලධාරී සේවයේ යෙදී සිටී. ඒ අනුව මේ වන විට අනුමත සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යනු ලැබේ.
දෙවන කොටස : **63.00**		
7	**කමිටුව විසින් පෙන්වා දී ඇති අඩුපාඩු**	**ආයතනින වශයෙන් ගනු ලැබූ පියවර සහ ඉදිරියේ දී ගැනීමට අපේක්ෂිත පියවර**
8	පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි	රා.ප.ව. 05/2018 අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තිය සකස් කර අවසන් කර ඇත.
9	ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි	සකස් කරන ලද පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තිය අනුව එවැනි ඇගයීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.
10	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව	තවද 2022-2025 වර්ෂය සඳහා රා.ප.ව. 02/2018 අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම මේ වන විට සකස් කර අවසන් කර ඇත.

	සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	
11	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2020 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ලෝකයේ සහ ශ්‍රී ලංකාවේ කොවිඩ් වසංගතය ව්‍යාප්තවීම සිදුවිය. ඒ අතුරින් 2021 වර්ෂය තුළ ඉතා දරුණු අන්දමින් ඩෙල්ටා ප්‍රභේදය ඇතුළු දැඩි අන්තරාකාරී ප්‍රභේද පැතිරීම සිදුවිය. ඒ අනුව දරුණු ලෙස ශීඝ්‍රයෙන් කොවිඩ් වසංගතය පැතිර යාම හේතුවෙන් දුරස්ථභාවය පවත්වාගැනීම සහ පුද්ගල ආරක්ෂාව හේතුවෙන් කාර්යාලය වෙත නිලධාරීන් පැමිණීම සීමා කර තිබූ අතර මාර්ගගත ක්‍රමය ඔස්සේ කාර්යාල කටයුතු සිදු කෙරිණි. එමනිසා 2021 වර්ෂය තුළද තුලදීද පුහුණු වැඩසටහන් පැවැත්වීමටද සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව සිදු නොවුණි.
12	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම. 2021 වර්ෂය තුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාල වෙත පැමිණීම සීමා කර තිබීම හේතුවෙන් සමහර නිලධාරීන් විසින් ලබාදීම ප්‍රමාදවී තිබුණද මෙවන විට සියළුම නිලධාරීන් විසින් නිසි පරිදි කාර්ය සාධන ගිවිසුම් ලබාදීම සිදුවේ.
13	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම යටතේ 2021 වර්ෂයේ රාජකාරි ලැයිස්තු අනුව ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) වෙත අදාළ වගකීම් පවරා තිබුණි.
14	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය පිරිසිදු මතයක් දක්වා වර්ධනය කර ගැනීමට පිණිස සාමූහික වශයෙන් අඩුපාඩු නිවැරදි කරගෙන කටයුතු කරන බව දන්වා සිටිමි.

ආචාර්ය බන්ධුල ගුණවර්ධන (පා.ම)

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය

2024 · 04 · 14